


කලින් කලට ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ පිරිස් අතරින් අපේම යමක් කරන්නට හැකියාවක් ඇති හා උනන්දුවක් ඇති අය දායාද කරපු දේවල් බොහෝමයි. මව්බිමේ වගේම මෙහි සිටින අප අතරත් කණ්ඩායම් සංගීතය ජනප්‍රියයි. කණ්ඩායමක් විදියට ගී ඉදිරිපත් කරනවාට අමතරව කවිය ගායනා කරන අය හට සංගීතය සැපයීමත් ඒ කණ්ඩායම්වල එක වගකීමක්. ඇත්තටම ඒක සේවයක්.

මේ විදියට මෙහි ඇරඹූ කණ්ඩායම් අතරින් " බී ෂාප් " සංගීත කණ්ඩායමට ඇත්තේ තරමක දිගු ඉතිහාසයක්. මේ වසරේදී කණ්ඩායම පිහිටවලා වසර 16ක් සම්පූර්ණ වෙනවා. ඉතින් ඒ කණ්ඩායම එදා පිහිටවලා අද වනතුරුම නායකත්වය දෙන රොෂාන් ප්‍රනාන්දු හිතවතාව කෙටි සාකච්ඡාවක් සඳහා දායක කරගත්තා.

"ඕස්ට්‍රේලියාවට පැමිණි මුල් කාලයේදී මම නොයෙකුත් සංගීතමය වැඩසටහන්වලට සහභාගි වුනා. මුලින්ම සංගීත කණ්ඩායමකට සම්බන්ධ වෙන්න කියලා ආරාධනා කළේ සුනිල් වීරසූරිය, විජිත අමරසේකර කියන හිතවතුන්."

"පස්සෙ කාලෙක මුණ ගැහුණ යාළුවෝ කීප දෙනෙක් එකතු වෙලයි "බී ෂාප්" :ඊ˜ˆය්රච* සංගීත කණ්ඩායම හදාගත්තේ. ඒ 1998 දී."

මේ තමයි ඊ˜ˆය්රච සොයුරු කැල. බටහිර තාලවාද්‍ය කට්ටලටය (ඩ්‍රම්ස්) වයන ඉඳුසර, සර පුවරුව වයන ශම්මි, නෙත් තාල වාද්‍ය භාණ්ඩ (පර්කෂන්) වයන නිලූක, සැක්සෆෝනය හා බටනලාව වයන ගිහාන්, ලීඩ් ගිටාරය වයන අශේන්, බේස් ගිටාරය වයන සුධීරා, රිදම් ගිටාරය වයන ධම්මික යන හත් දෙනා සමඟ රොෂාන් ගායනයෙන් එක් වෙමින් "බී - ෂාප් " කණ්ඩායම මෙහෙයවනවා. ඒ අතරේම ශබ්ද පරිපාලනය කරන්නෙත් රොෂාන්මයි.

රොෂාන් මේ විදියට තමන්ගේ මතකය තවත් අළුත් කළා.

"අපි කණ්ඩායම හදන කොට තවත් ඒ වගේ අය හිටියේ කණ්ඩායම් අතලොස්සයි. අපි පටන් අරගෙන අවුරුදු කිහිපයකින් ප්‍රියා සූරියසේන මහත්තයගේ ප්‍රසංගයකට සහභාගි වීමට ලැබීම ගැන කවුරුත් කථා උනා. ඊට පස්සේ මේ වෙනකල් විටින් විට ලංකාවෙන් ආව ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ ප්‍රසංගවලට අපි සංගීතය සැපයුවා."

ඒ වගේම ගොඩක් වාදකයින්ට ආරම්භක වේදිකාව වුණේ අපේ වේදිකාවයි. දැන් ඒ අය බොහොම හොඳ තැන්වල වාදන කටයුතු කරනවා. ඒ ගැන මට හරිම සතුටුයි. ඒ වගේම මෙහේ ගී ගයන්න හැකියාවක්, ආසාවක් තියෙන බොහොම දෙනෙකුට අපි කතා කරලා ඒ අයට ගායනා කරන්න අවස්ථාව ලබාදෙනවා. ඒ අයත් දැන් ඉදිරියට ගිහින්. සමහර අය තමන්ගේම ගීත ඇතුලත් සංගත තැටි පවා කරලත් තියෙනවා.

ඒ ආකාරයෙන් මෙල්බන් නුවර ගායනයට ලැදි පිරිස පහලොස් දෙනෙකුට ගී ගැයීමට වේදිකා නිර්මාණය කරලා අවස්ථාව දුන් " මෙ පුර" ගී ප්‍රසංගය මෙහි අපේ ස්වතන්ත්‍ර ගී ඉතිහාසයේ නොමැකෙන පියවරක් වුණා. එහි සංකල්පය රොෂාන්ගෙයි. එතරම් අසා නැති එවන් ගී තිහක් පමණ ප්‍රමාණයකට සංගීතය සැපයුවෙත් "බී - ෂාර්ප්" කණ්ඩායමයි. දාසයවන වර්ෂ පූර්ණය පිළිබඳව අප රොෂාන්ගෙන් ඇසුවා.

"බටහිර සංගීතය වගේම අපේ ජන සංගීතය ඇසුරෙනුත් විශාල පරාසයක විහිදෙන අංග ඉදිරිපත් කරන්න දැන් අපේ කණ්ඩායමට පුළුවන්. කොටින් ම කියනවා නම් "සැක්සෆෝනය" වගේ ම බටනලාවත් වාදනය කරන්න පුළුවන් අය අපි අතර ඉන්නවා. ඉතින් අපි හිතුවා වෙනස් විදියක ප්‍රසංගයක් ඉදිරිපත් කරන්න. ලංකාවේ ජනප්‍රිය ගීතවලට අපි නිර්මාණය කරපු සංගීතාංගත් එක් කරලා කරන ප්‍රසංගයක් මේ. ඉතින් අපිත් එක්ක එකට හිටපු කට්ටියටත් අනික අනික් හැමෝටමත් අපි ආරාධනය කරනවා ඇවිත් ප්‍රසංගය බලන්න කියලා. හොඳ නරක අපිට කියන්න කට්ටියක් ඉන්න එකත් අපිට ලොකු සතුටක්.

අපි රොෂාන්ට ස්තූතිවන්ත වෙමින් සුභ පැතුවා. ප්‍රසංගය සැප්තැම්බර් මාසේ 21 වෙනි ඉරිදා හවස හයට හැම්ඩන් පාක් ප්‍රදේශයේ "රිවර්ගම් තියටර්" ශාලාවේදී පැවැත්වෙනවා.

සටහන : සිසිර දිසානායක







බිනිඳු කළුගලගේ
3-4 වසර
සිංහල භාෂා පාසල රොක්ස්බර්ග් පාක්


මම

මගේ නම ප්‍රසාදි ලියනගේය. මට වයස අවුරුදු 12යි. මම පැස්කොවේල් ගර්ල්ස් විද්‍යාලයට යනවා. මම සෙනසුරාදාට සිංහල භාෂා පාසැලට යනවා. එහෙන මට යාලුවෝ ගොඩාක් ඉන්නවා. පාසැලේ අපි අවුරුදු උත්සව සහ විවිධ ප්‍රසංග පවත්වනවා. මගේ පවුලේ අම්මයි, තාත්තයි අක්කා සමග බලු පැටියෙක් ඉන්නවා. අක්කාගේ නම ප්‍රශාන්ති. බලු පැටියාගේ නම ජැකී. තාත්තාගේ නම අජිත් වන අතර අම්මාගේ නම චාන්දනීය. අම්මා ලංකාවේ ගුරුවරියක් විදියට සේවය කළා. තාත්තා කාර්මික ශිල්පියෙකු ලෙස රැකියාව කරනවා. ඉදිරියේදී මට වෛද්‍යවරියක් වෙන්න ආසයි.

ප්‍රසාදි ලියනගේ
7/8 ශ්‍රේණිය

පුංචි හපනුන්ගේ නිර්මාණ
මේ ඊමේල් ලිපිනයට එවන්න

sannasanews@gmail.com

## ලේ දන් දීමේ ව්‍යාපාරයක්

AUSCA ඔස්කා සංවිධානය සංවිධානය කරන ලේ දන් දීමේ ව්‍යාපාරයක් ඔක්තෝබර් මාසයේදී පැවැත්වෙයි.

ශ්‍රී ලාංකික ප්‍රජාවෙන් අසරණ රෝගීන් වෙත පිදෙන සේවාවක් ලෙස සංවිධානය කෙරෙන මේ වැඩ සටහන පැවැත්වෙන දිනය හා ස්ථානය ඉදිරියේදී එබට දන්වා සිටින්නෙමු. ඔබත් ලේ බිඳක් දන් දී අප සමග එක්වන්න.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අය කරුණාකර මෙම දුරකතන අංක වලින් වැඩි විස්තර ලබා ගන්න.

මේ සත් කාර්යයට සහභාගිවන මෙන් ඔබ සැමගෙන් ඔස්කා සංවිධානය කාරුණිකව ඉල්ලා සිටියි.

දීපාල් - 0403 161 516
පුෂ්පික - 0401 934 088
මිලෝන් - 0488 307 368
චිත්‍රා - 0430 432 920
ඊමේල් ssjayawi@gmail.com